පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව

සතිය: 37

විෂය නර්තනය

ශ්‍රේණිය 13

සැකසුම: දුල්මිණි මීගස්තැන්න.
ර/දොඩම්පෙ ශ්‍රී රාහුල මහා විද්‍යාලය

නිපුණතාව 02- නර්තනය හා සබැඳි සිද්ධාන්ත අධ්‍යයනය කරමින් ප්‍රායෝගිකව භාවිතා කරයි
නිපුණතා මට්ටම - . 2.3 නිර්දේශිත ගායනය,නර්තනය හා සබැඳි කවිපද කොටස් ප්‍රස්තාර කරයි.
ක්‍රියාකාරකම - 2.3 නිවැරදි ව ප්‍රස්තාරකරණයේ යෙදෙමු.

නිවැරදි පිළිතුර තෝරන්න.

1.ගජගා වන්නමෙන් වර්ණනා වන්නේ,
1)මංගල සංඛය ගැනය. 2)රජෙකුගේ උදාරත්වය ගැනය.
3)ගණදෙවියන්ගේ නුවණ ගැනය. 4)මංගල හස්තිරාජයා ගැනය.
2.ගජගා වන්නම ප්‍රස්තාර කරනු ලබන්නේ,
1)සුළු තනි තිතටය. 2)දෙසුළුමහ තුන්තිතටය.
3)මහතනි තිතටය. 4)සුළු මහ දෙතිතටය.
3.කිරිමඩු ශාන්තිකර්මයේ පුද ලබන දෙවිවරු සදහන් වරණය වන්නේ,
1)කොහොඹාදෙවි තුන්කට්ටුව 2)මංගර,පත්තිනි ප්‍රධාන දෙවිවරුන්
3)දෙවොල්, පත්තිනි පරිවාර දෙවිවරුන් 4)විශ්නු,සමන්,දෙවොල්,නාථ යන දෙවිවරුන්
4.කිරිමඩු ශාන්තිකර්මය පැවැත්වීමේ මූලික පරමාර්ථය වන්නේ,
1)ගව මහිෂාදීන්ට වැළදෙන රෝගාදියෙන් එම සතුන් මුදවාගැනීමටය.
2)භව භෝග සම්පත් හා සශ්‍රීකත්වය ලගාකර ගැනීමටය.
3)ස්ත්‍රීන්ට වැළදෙන රෝගාදිය දුරුකර ගැනීමටය .
4)භවභෝග වලට වැළදෙන්නාවූ රෝගපීඩාදිය දුරුකර ගැනීමටය .
5.කොහොඹාහැල්ලෙන් වර්ණනා වන්නේ,
1)කොහොඹ ශාකය පිළිබඳ වර්ණනාවකි. 2)කොහොඹාකංකාරියේ එන නාට්‍යමය පෙළපාලියකි.
3)විජය කුවේණියගේ කතාපුවත වර්ණනාවකි. 4)කොහොඹාදෙවියන්ගේ උපත් කතාව පිළිබඳ වර්ණනවකි.

හිස්තැන් සදහා නිවැරදි පිළිතුර යොදන්න

6)ප්‍රස්තාරකරණයේදී මාත්‍රා කිහිපයක් කැටිවනවිට අදාළ මත් කැටි අක්ෂරවලට යටින් ..... යන සංඥා සලකුණ යොදනු ලැබේ.
7)ගජගා වන්නමේ බෙරපදය.....වේ.
8)ප්‍රස්තාරකරණයේදී තිත්..... ලෙසත් තෙයි..... ලෙසත් සංකේත කරයි.
9)තාල වාදනයේදී තිත් හා තෙයි යන නාද .....හා..... ලෙසද හඳුන්වයි.
10)කිසියම් ගායනයක්,වාදනයක් තාලය තැබීමත් සමග ආරම්භ නොවන්නේ නම් ඒ සදහා..... සංඥා සලකුණ යොදනු ලැබේ.

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

11)ගජගා වන්නම,කිරිමඩු ශාන්තිකර්මයට අයත් කවියක් අදාල තාලරූපයට අනුව ප්‍රස්තාර කරන්න.
12)ප්‍රස්තාරකරණය යන්න කෙටියෙන් හඳුන්වන්න.
13)තාලම්පටෙන් තිත් හා තෙයි යන නාද නිවැරදිව වාදනය කරන අයුරු පහදන්න.
14)කොහොඹා හැල්ල සහ රටයකුමේ කවිය බැගින් අදාල තාලරූප අනුව ප්‍රස්තාර කරන්න.